**සංස්කරණය/Editor**
අසෝක සුබසිංහ Asoka Subasinghe

**උපදේශක සංස්කාරක**
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක**
අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ**
**Page Layout & Graphic Designs**
සාමන්ත තැන්නගේ Saamantha Tennege
**Horizon -** Jagath J Edirisinghe

**සමබන්ධීකරණය**

| | |
|---|---|
| **NSW** | **WA** |
| Lakshman Kodituwakku | Kapila Hemantha Balage |
| 02 9626 7660 | |
| 02 9837 5055 | 08 9456 1972 |
| **QLD** | **ACT** |
| Ananda Samaratunga | Asoka Nimalasiri |
| 07 3372 7953 | 0400 429 031 |
| **SA** | **TAS** |
| Chandra Eeriyagama | Anura Seneviratne |
| 08 8331 2318 | 03 6327 4259 |

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9796 4241

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

### සුබ නව වසරක් !

උදා වූ මේ නව වසර පාඨක ඔබ සැමටත් අනුග්‍රාහක ව්‍යාපාරික හිතවතුනටත් යහපත් වසරක් වේවායි සන්නසේ අපි ප්‍රාර්ථනා කරන්නෙමු. නව වසරක ඇරඹුම යනු සුභ කටයුතු ආරම්භ කිරීම සඳහා සුදුසුම වකවානුව බව සමාජයේ පොදු පිළිගැනීමයි. එනමුදු නොයෙකුත් පැතුම් මැද අරඹන බොහෝ කටයුතු සාර්ථක නොවන්නේ ඒවා අරඹන කාලයේ වරදින් නොව, ඒවායෙහි නිසි එල්ලයක් පැහැදිලි අරමුණක් හා දැඩි කැපවීමක් නොමැති වීම නිසා බව අප පිළිගත යුතුය. පුද්ගලික වේවා, සාමාජීය වේවා කුමන අරමුණකින් ඇරඹුවද ඒ සඳහා ක්‍රමානුකූල වැඩ පිළිවෙලක් හා කරන දේ පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. ජීවිතය ජයගත් බොහෝ දෙනෙකුගේ පසුබිම සොයා බැලුවහොත් ඔවුන්ගේ අතීත ගමන්මග දැඩි කැපවීමක් අධිෂ්ඨානයක් මත ගොඩ නැගී ඇති බව අපට පෙනී යයි. කාලයද ජීවිතයට ඉතා වැදගත් බව සැබෑය. එහෙත් සුභ හෝරාවටම සියල්ල පවරා සිටියහොත් අත්විඳිය හැක්කේ අභාග්‍යයයි. එබැවින් මේ වසර තුල තමන් ගැන මෙන්ම සමාජය වෙනුවෙන්ද යමක් කළ හැකි වසරක් කර ගැනීමට අධිෂ්ඨාන කර ගනිමු.

***හිටපු හමුදාපතිවරයාගේ මා පහත සඳහන් කරන ප්‍රකාශයත් ඉහත කී පුවත්පතේ පළවූ ආන්දෝලනාත්මක සිද්ධියත් එකට එක ගැටේ. ෆොන්සේකා මහතාගේ ප්‍රකාශය මෙසේය.***

***'.......... අවුරුදු පහළොවක් විතර ඇමරිකාවේ ලංකාවේ කෝපරල් කෙනෙක් කරන රස්සාවක් කරලා ආපසු ලංකාවට ඇවිත් ......... දැන් ලොක්කො වෙලා ඉන්නවා ..... කෝපරල් කෙනෙකුගේ රස්සාව කරපු කෙනෙකුට මෙහිදී වැඩිම වුණොත් හම්බවෙන්නෙ සාජන් කමක්...........***

***දැනට පිටරට පදිංචි විශ්‍රාමික හමුදා නිලධාරීන් බොහෝ දෙනෙකු කරන්නේ පෞද්ගලික ආරක්ෂක ආයතනවල රැකියාවන්ය. ඕස්ට්‍රේලියාවේ පදිංචි මා දන්නා විශ්‍රාමික හමුදා කර්නල්වරු දෙදෙනෙක් මේ රැකියාවෙ යෙදී සිටිති. ශ්‍රී ලංකාවේ උසස් විශ්ව විද්‍යාල කතිකාචාර්ය ධූරයන් දැරූ විද්වතෙක් සිඩ්නි නගරාසන්න දුම්රිය පොළක ප්‍රවේශ පත්‍ර රැකියාවක යෙදී සිටී. විදේශගත වී රැකියාවේ යෙදී සිටින අයට සමච්චල් කිරීම කොතරම් සදාචාරාත්මක ද නැද්ද යන්න ජනතාව තීරණය කළ යුතුය.***

# ජාතියට විනා කරන අදූරදර්ශී ප්‍රලාප

බ්‍රිතාන්‍ය යටත් විජිත වාදයෙන් මිදී ලංකාවට සම්පූර්ණ නිදහස ලබා ගැනීමේ අධිෂ්ඨානාත්මක සමකාලීන, දේශපාලන සංග්‍රාමය දියත් වූයේ 1930 දසකයේ උදාවත් සමඟය.

පුරන්අප්පු සහ ගොන්ගාලේගොඩ බණ්ඩා වැනි දේශප්‍රේමී නායකයන් නායකත්වය දුන් 1848 විමුක්ති සටන මර්දනය කිරීමෙන් පසු යටත් විජිත වාදීන් රටේ ප්‍රභූ පන්තිය තම අන්තේවාසිකයන් බවට පත් කර ගත්තේ නව (වහල් චින්තනය) සීරුවෙන් (හීන් නූලෙන්) ක්‍රියාත්මක කරමිනි.

අමද්‍යප ව්‍යාපාරය වැනි අහිංසක සාරධර්ම රැකීමේ ප්‍රයත්නයන්ද සාර්ථක වනු දකින්නට සුදු හාම්පුත්තු කැමැත්තක් නොදැක්වූහ. 1915 කුරිරු මර්දනය නිසා එබඳු ව්‍යාපාරද අඩපණ විය.

1930 දී ඉන්දියානු ජාතික සංගමය ඇරැඹූ අධිරාජ්‍ය විරෝධී අහිංසක නිදහස් සටනේ නායකයා වූ මහත්මා ගාන්ධි සහ ශ්‍රීමතී කමලාදේවී චට්ටෝපාද්‍යාය ලංකාවේ චාරිකාවක යෙදුණු අවස්ථාවේ ඔවුන්ට ප්‍රබුද්ධ ලක් දූ පුතුන්ගේ ඉමහත් ගෞරවය හා හරසරය ලැබුණු අන්දම ඉතිහාසයේ නව පිටුවක් පෙරලන්නට සමත් විය.

ඒ සංචාරයේ ප්‍රතිඵලයක් වූයේ පළමු වන සමකාලීන නිදහස් සංග්‍රාමය වශයෙන් යාපනයේ තරුණ සංගමය බිහිවීමය.

1933 දී සූරියමල් ව්‍යාපාරය ඇරඹීමත් සමඟ ජාතික නිදහස් සටනේ (සමකාලීන යුගයේ) දෙවන පරිච්ඡේදය ඇරැඹුණේය.

ඊට දෙවසරකට පසු 1935 දෙසැම්බර් මස 18 වැනි දින ලංකා සම සමාජ පක්ෂ බිහිවීමත් සමඟ නිදහස් සටනේ නව දේශපාලන අදියර ඇරැඹුණේය.

ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ සීමිත බලතල සහිත රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දෙවන මැතිවරණය පැවැත් වුණේ 1936 පෙබරවාරි මාසයේය.

එවකට මොරවක මන්ත්‍රීධූරය දැරූ දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ සහ අවිස්සාවේල්ලට පිලිප් ගුණවර්ධන, රුවන්වැල්ලට ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා යන තිදෙනා ලංකා සම සමාජ පක්ෂයේ නිල අපේක්ෂකයන් වශයෙන්ද පානදුර ආසනයට ලෙස්ලි ගුණවර්ධන මහතා නිල නොවන පාක්ෂිකයෙක් වශයෙන්ද ඉදිරිපත් කරන ලදී.

දොස්තර ඇස්.ඒ. වික්‍රමසිංහ හා ලෙස්ලි ගුණවර්ධන යන දෙපොළ ජයග්‍රහණය නොකළද ඉතා බලගතු වලව් අපේක්ෂකයන් දෙදෙනෙකු පරාජය කරමින් පිලිප් හා ඇන්.ඇම්. මැතිසබයට ප්‍රවිශ්ට වූහ.

### අධිරාජ්‍ය විරෝධී සංග්‍රාමය

රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කතා නායකයා වූ බටදොළ වලව්වේ ෆොරැස්ටර් ඔබේසේකර මහතා පරදවා පිලිප් ගුණවර්ධන ජයග්‍රහණය කරද්දී ඇන්.ඇම්. පරාජය කළේ ලංකාවේ පළමුවන මන්ත්‍රීවරිය වු මීදෙනිය වලව්වේ ඇඩ්ලින් මොලමුරේ කුමාරිහාමිය.


රාජ්‍ය මන්ත්‍රණ සබාව තුළ වේගවත් අධිරාජ්‍ය විරෝධී සංග්‍රාමය ඇරැඹුණේ එදා පටන්ය.

ඇන්.ඇම්. හා පිලිප්ට සහයෝගය දක්වන සම සමාජ පාක්ෂිකයෙකු නොවු තවත් ප්‍රතාපවත් මන්ත්‍රීවරයෙක් දකුණින් තේරී පත්වීය. දැඩි අධිරාජ්‍ය විරෝධියෙකු වූ ඔහු නමින් ඩී.ඇම්. රාජපක්ෂය.

1940 දී අධිරාජ්‍ය විරෝධී සටන මුවහත් වූයේ කම්කරු වැඩ වර්ජන වලිනි. සුදු පාලකයන්ගෙ "වහල් කඳවුරු" බවට පත්ව තිබු වතු අධිරාජ්‍යයේ පීඩිත කම්කරුවන් නිදිගැට හැර පිබිදෙන්නට පටන් ගත්තේ 1940 දසකයේ උදාවත් සමඟය.

මුල්ඔය වත්තේ වැඩ වර්ජනයේදී ගෝවින්දන් නමැති වතු කම්කරුවෙක් පොලිස් වෙඩි පහරින් මිය ගියේය. ඊට විරෝධය පාමින් ගෝල්ෆේස් පිට්ටනියේ පැවැත් වූ යෝධ ජන රැළිය අමතා සම සමාජ නායකයන්ට අමතරව හම්බන්තොට මන්ත්‍රී ඩී.එම්. රාජපක්ෂ මහතා කළ කතාවෙන් කොටසක් 1962 දී මවිසින් සිළුමිණ සහ ඔබ්සර්වර් යන පුවත්පත්වල ලියූ ලිපි පෙළක පළ කළෙමි. ඒ ලිපි 2007 ප්‍රකාශයට පත් කරන

4 වන පිටුවට



*ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්*

එස්. පියසේන